**නේපාලයේ පොඛාරා හි පැවැත්වීමට නියමිත සාර්ක් අන්තර් - සමුළු සැසිවාරය: 2016 මාර්තු 14 - 17**

දකුණු ආසියානු කලාපීය සහයෝගීතා සංගමයේ (SARRC) අන්තර් සමුළු සැසි වාරය, 2016 මාර්තු 14 - 17 දිනවලදී නේපාලයේ පොඛාරා හි දී පැවැත්වීමට නියමිතය. 2014 නොවැම්බර් මස කත්මණ්ඩු හි දී පැවති 18 වැනි සාර්ක් සමුළුවේ ගනු ලැබූ තීරණ අතුලුව විවිධ සාර්ක් සංසදවලදී ගනු ලැබ ඇති තීරණවල ප්‍රගතිය විමසා බැලීම සඳහා හා ප්‍රමුඛතාව ලබාදිය යුතු කරුණු හඳුනාගැනීම සඳහා සාමාජික රටවලට ඉඩප්‍රස්ථාව ලබා දෙනු ඇත.

අධ්‍යක්ෂ ජෙනරාල්වරුන්ගේ මට්ටමින් පවත්වනු ලබන සාර්ක් වැඩසටහන් කමිටුවේ 02 වැනි සැසිවාරය මාර්තු 14 - 15 නේපාලයේ ආරම්භවීමටද, විදේශ ලේකම්වරුන්ගේ මට්ටමින් පැවැත්වෙන 42 වැනි සාර්ක් ස්ථාවර කමිටුව 2016 මාර්තු 16 වන දින පැවැත්වීමට නියමිතය. මෙම රැස්වීම්වලදී සාර්ක් අමාත්‍ය මණ්ඩලයේ 37 වැනි සැසි වාරය සඳහා විෂය පථය සැකසෙනු ඇත. අමාත්‍ය මණ්ඩල රැස්වීම සඳහා සහභාගී වන ශ්‍රී ලංකා නියෝජිත කණ්ඩායමේ නායකත්වය උසුලනු ලබන්නේ විදේශ අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා විසිනි. මෙම අමාත්‍ය මණ්ඩල රැස්වීම, නේපාල අග්‍රාමාත්‍ය අතිගරු කේ. පී ශර්මා ඔලී මැතිතුමා විසින් 2016 මාර්තු 17 වැනි දින සමාරම්භනය කිරීමට නියමිතය.

සාර්ක් සමුළුවේ සහභාගීත්වය පාකිස්ථානය වෙත ලබාදීම සඳහා මෙම වසරේ නොවැම්බර් මස පාකිස්ථානයේ දී පැවැත්වීමට නියමිත 19 වන සාර්ක් සමුළුවට පෙර පවත්වනු ලබන අවසාන ඉහළ පෙළේ රැස්වීම වන්නේ මෙම සැසියයි.

මෙම අමාත්‍ය මට්ටමේ රැස්වීම අතරතුරදී තරුණයන් වෙනුවෙන් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීම සඳහා සාමාජික රාජ්‍යයන් වෙත කලාපීය රාමුවක් හා වේදිකාවක් සැපයෙන ආකාරයේ සාර්ක් තරුණ ප්‍රඥප්තියට අත්සන් තැබීමට විදේශ අමාත්‍යවරු අපේක්ෂා කරති. සංවර්ධන ව්‍යාපෘති වලට අරමුදල් ලබා ගැනීමට අයදුම් කිරීම සඳහා සාමාජික රාජ්‍යයන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියාවලිය සරල කිරීම පිණිස සාර්ක් සංවර්ධන අරමුදලේ (SDF) ප්‍රඥප්තිය සංශෝධනය කිරීමටද විදේශ අමාත්‍යවරුන් විසින් මෙහිදී කටයුතු කරනු ඇත.

මෙම සභා රැස්වීමට සමගාමීව, විදේශ කටයුතු අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා විසින් නේපාලයේ අග්‍රාමාත්‍යවරයා සහ වෙනත් සාර්ක් රටවල් කිහිපයක විදේශ අමාත්‍යවරුන් සමග ද්විපාර්ශ්වික රැස්වීම්ද පැවැත්වීමට කටයුතු කරනු ඇත.

2015 අප්‍රේල් මාසයේ හටගත් භූ කම්පනයෙන් දැඩි ලෙස හානි වූ කත්මණ්ඩු නුවර පිහිටි ආනන්ද කුටි බෞද්ධ විහාරය හා රාටෝ මචින්ද්‍රනාත් හින්දු දේවස්ථානය පිළිසකර කිරීමේ කටයුතු ශ්‍රී ලංකාව විසින් සිදු කරනු ලබන අතර විදේශ කටයුතු අමාත්‍යතුමාගේ නේපාල සංචාරය අතරතුරේදී එම ප්‍රතිසංස්කරණ කටයුතු සම්බන්ධව නිරීක්ෂණය කිරීමටද එතුමා අපේක්ෂා කරයි.

විදේශ කටයුතු අමාත්‍යාංශය
කොළඹ - 01
2016 මාර්තු 14